**ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව**

**------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරි හා ගණන්දීමේ නිලධාරී  සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය  ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන්  වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම**

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවරා දෙන ලද රු.3,500,000 ක් වටිනා මගී වාහනය ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් කර තිබුණ ද මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛණය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. | එකග නොවෙමි. මෙම දෙපාර්තමේන්තුවට තාවකාලිකව පවරා ගත් වාහන දෙකක ද අගයයන් ඇතුලත් කර ඇත. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) නොසැසඳීම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2017 වර්ෂයේ විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම්වල මගී වාහන (කල්බදු) වල අවසන් ශේෂය හා 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ආරම්භක ශේෂ අතර රු.බිලියන 13.5 ක වෙනසක් විය. | ආරම්භක ශේෂ සඳහා වෙනස්කම් සිදු කරන විට මූල්‍ය ප්‍රකාශ තුලින් සිදුකිරීමට කටයුතු කළයුතු වීම. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි යාවත්කාලීන කර කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් සියළුම වාහන ඇතුලත් කර නියමිත පරිදි ගිණුම් ප්‍රමිතයන්ට අනුකූලව සිදුකර ඇත. |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| කල්බදු පදනම මත දෙපාර්තමේන්තුවට පවරා ගත් රු.මිලියන 19 ක් වූ මෝටර් | වත්කමක්හි සත්‍ය වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුළින් පිළිඹිබු | එකඟ නොවෙමි. |

| | | |
|---|---|---|
| රථ 04 ක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ මගී වාහන තුළ ඇතුළත් කර තිබුණු අතර, එම වත්කම් මගී වාහන (කල්බදු) වට්නාකම තුලින් ඉවත් කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවුණි. | කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම වාහන වට්නාකම් කල්බදු වට්නාකමින් ඉවත් කර දෙපාර්තමේන්තුවට පවරාගෙන ඇත. එබැවින් ද්විගණනයක් සිදුවී නොමැත. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 අග්‍රිම කළමනාකරණය**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 වර්ෂය තුලදී රු.මිලියන 6,767 ක අග්‍රිම ඉල්ලුම් කිරීම සඳහා සැලසුම් කර තිබුණු අතර රු.මිලියන 14,084 ක් ඉල්ලුම් කර තිබුණි. එහෙත් භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුවට නිකුත් කර තිබුණු අග්‍රිමය රු.මිලියන 6,128 පමණක් විය. | අග්‍රිමය නිසි පරිදි සැලසුම් කිරීමට හා අග්‍රිමය ඵලදායි ලෙස කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතු වීම. | එකඟ නොවෙමි.<br>ඉල්ලුම් කරන ලද අග්‍රිම නියමිත පරිදි නොලැබීම නිසා ඉදිරි මාසවලදී, පසුගිය මාසයන්හි නොලැබූ අක්මුදල් ප්‍රමාණය ද එකතුකර ඉල්ලුම් කරන ලදී. |
| (ආ) 2008 වර්ෂයේ ලබා දුන් රු.83,325 ක විදේශ ගමන් අත්තිකාරම 2019 මැයි 31 දින වන විටත් පියවා නොතිබුණි. | අත්තිකාරම කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම | මෙම මුදල පියවන ලෙස නීතිපති මඟින් දන්වා යවන ලදී. |

**2.2 ආදායම් කළමනාකරණය**

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආදායම් ගිණුමක වර්ෂ 03 ක පමණ කාලයක සිට වැරදි ගිණුම්ගත කිරීම් නිවැරදි කිරීම පමණක් සිදු කර තිබුණු අතර එම නිවැරදි කිරීම් අවසන් කර ගිණුම වසා දැමීමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව එම ගිණුමෙන් රු. මිලියන 27.6 ක් | මෙම ආදායම් ගිණුම සම්බන්ධයෙන් පවතින ගැටළු විධිමත් පරිදි නිරාකරණය කර ගිණුම වසා දැමීමට අවශ්‍ය කටයුතු කළයුතු වීම. | අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් සිදුකරනු ලබන වැරදි ගිණුම්ගත කිරීම නිවැරදි කිරීම නිසා මෙම ආදායම් ගිණුම බැර කිරීම් ආදායමින් ආපසු ගෙවීම් පෙන්නුම් කරනු ලබයි. |

මුදලින් ආපසු ගෙවීම් කර තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**2.3 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26 ක් වී තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල කිරීමට කටයුතු කිරීම. | මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහනවලට සහ ජුලි වැඩවර්ජකයින් සඳහා වන ගෙවීම් වලට අදාල ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය තොරතුරු නියමිත දිනට ඉදිරිපත් නොවීමත් විදේශ ගමන් සීමා වීමත් නිසා මෙම ඉතිරිය සිදුවිය. |
| (ආ) | වාර්ෂික ප්‍රතිපාදන වෙන් කර නොතිබුණු වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු යටතේ ප්‍රතිපාදන ලබා ගෙන තිබුණු අතර එහි ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 ක් විය. | -එම - | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | කිසියම් වියදම් ශීර්ෂයකට ඍජුව වෙන් කිරීමට හැකියාව ඇති හා සෑම වසරකම වියදම් දරන වැය විෂයයන් සඳහා පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් යටතේ ප්‍රතිපාදන වෙන් කර තිබුණි | පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන්කිරීම විශේෂිත අවස්ථා වලදී පමණක් කළ යුතු වීම.<br><br>වාර්ෂික ප්‍රතිපාදන අවශ්‍යතාවය අනුව හා තාත්වික ලෙස සිදුකල | එකඟ නොවෙමි.<br><br>සියළුම දෙපාර්තමේන්තු සඳහා වන මෙවැනි සුභසාධන වැඩසටහන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පරිපූරක සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයයෙහි සුභසාධන වැඩසටහන් යටතේ සලසා ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) වැය විෂයයන් 03 කට අදාලව මු.රෙ. 66 - 69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම සියයට 18 සිට සියයට 320 දක්වා පරාසයක විය. | යුතු වීම. | ඉන්ධන මිල වැඩිවීම සහ අයවැය ඇස්තමේන්තු කිහිප වතාවක් සංශෝධනය කිරීම වැනි හේතුන් නිසා මු.රෙ. 66 මගින් ප්‍රතිපාදන වැඩිකර ගැනීමට සිදුවිය. |
| (ඉ) එක් වැයවිෂයයක් සඳහා මූලික ඇස්තමේන්තුවෙන් හා මු.රෙ. මාරුකිරීම් යටතේ රු.බිලියන 28 ක් වෙන්කර තිබුණි. නමුත් ඉන් රු.බිලියන 27.9 ක් නැවතත් වෙනත් ශීර්ෂවලට මුදා හැර තිබුණු අතර රු.මිලියන 71.2 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මු.රෙ මාරුකිරීම් අවශ්‍යතාවය අනුව පමණක් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම | එකඟ වේ. |

## 2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ගෙවන ලද වටිනාකම හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව බැරකම් 05 කට අදාලව රු.4,592,531 ක වෙනසක් විය. | බැරකම් ප්‍රකාශයේ ඇති බැරකම් සඳහා පමණක් ගෙවීමට කටයුතු කිරීම | එකඟ නොවෙමි. බැරකම් ප්‍රකාශය අනුව අගය සහ වවුචර් අගය අතර විවිධ හේතුන් නිසා ඇති වූ මුළු වෙනස රු. 4,952,531 කි. |
| (ආ) ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කර ගැනීමකින් තොරව රු.663,968,955 ක් වූ බැරකම් වලට එළඹ තිබුණි. | බැඳීම ඇති කර ගැනීමට ප්‍රථම ඒ සඳහා අදාල වැය විෂයයන් තුල ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කර ගත යුතු වීම | අදහස් දක්වා නොමැත. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| 2010 දෙසැම්බර් 31 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 150 | දෙපාර්තමේන්තු 03 ක් වෙනුවෙන් මිලදී ගත් වාහන 08 ක කල්බදු ගෙවීම් 2016, 2017 හා 2018 වර්ෂවල අවසන් වී තිබුණද එම වාහන පැවරීම් කටයුතු අවසන් කර නොතිබුණි. | කල්බදු ගෙවීම් අවසන් කරන ලද වාහන අදාල ආයතන සඳහා විධිමත් පරිදි පැවරීම, ගිණුම් තැබීම, ලේඛන යාවත්කාලීන කිරීම කළ යුතු වීම. | එකඟ නොවෙමි. වාරික ගෙවා අවසන් වාහන පවරා ගැනීම් සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අයවැය යෝජනා 18 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණු අතර, යෝජනා 10 ක් සඳහා වෙන්කළ ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම හේතුවෙන් හා යෝජනා 47 ක් සඳහා වෙන්කළ ප්‍රතිපාදන ඌන උපයෝජනය කිරීම හේතුවෙන් අපේක්ෂිත පරිදි අරමුණු ඉටුකර ගෙන නොතිබුණි. | අයවැය යෝජනා ආර්ථිකභාවයෙන්,ඵලදායි හා කාර්යක්ෂම ලෙස ඉටුකිරීමට අවශ්‍ය විධිවිධාන යෙදවීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම. | එකඟ වේ. ආයතනවල සුමට ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලැසීමට තරම් ප්‍රතිපාදන නොපවතින අවස්ථාවලදී එවැනි වූ උපයෝජනය නොවන ප්‍රතිපාදන නිසි පරිදි වැය විෂයය අංක වෙත මාරු කරගෙන සමස්ථ ප්‍රතිපාදනය කළමනාකරණය කිරීමට කටයුතු කරනු ලබයි. |
| (ආ) | ජාතික ආර්ථික සභාව පිහිටුවීම සඳහා වූ පුනරාවර්තන වියදම රු. මිලියන 270 ක් හා | ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල කිරීමට කටයුතු කළයුතු වීම. | අදාල වැය දරන ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ ඉල්ලීම සලකා බලා අවශ්‍යතාවය මත මු.රෙ. 66/69 යටතේ ප්‍රතිපාදන මාරු කර |

| | |
|---|---|
| ප්‍රාග්ධන වියදම රු. මිලියන 30 ක් වුවද, මූල්‍ය ප්‍රගතිය අනුව පුනරාවර්තන වියදම රු. මිලියන 70 ක් හා ප්‍රාග්ධන වියදම රු.මිලියන 230 ක් වී තිබුණි. | ඇත. |

### 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රාජ්‍ය සේවයේ ක්ෂේත්‍ර නිලධාරින්ට ලබා දුන් මෝටර් බයිසිකල්වලට අදාළ කල්බදු වාරික ගෙවා අවසන් කිරීම සඳහා වූ රු.මිලියන 247.6 ක ශේෂයක් තැන්පත් ගිණුම තුල රඳවා ගෙන තිබුණද 2019 මැයි 22 වන විටත් නිරවුල් කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරීමට අවශ්‍ය විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු වීම | අදාල විස්තර ලැබෙන තෙක් මෙම නිරවුල් කිරීම් කළ නොහැකිය. |
| (ආ) දෙපාර්තමේන්තු සේවයෙන් මුදා හැර තිබුණු නිලධාරිණියකුගෙන් අයවිය යුතු වසරකට වඩා පැරණි ණය රු. 150,014 ක් 2019 අප්‍රේල් වනවිටත් නිරවුල් කරගෙන නොතිබුණි. | - එම - | මෙම ණය ශේෂය නිරවුල් කරන ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලය වෙත දැනුම් දී ඇත. |
| (ඇ) වර්ෂ 15 කට අධික කාලයක සිට පැවත එන, මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 305,621 ක් වූ ණය ශේෂයන් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි. | -එම- | මෙම ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. |
| | කඩිනමින් අයකර ගත යුතු වීම | |
| (ඈ) සේවය හැර ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය එකතුව රු.307,599 ක් විය. | | සේවය අතහැර ගොස් ඇති එක් නිලධාරියකුගෙන් රජයට අයවිය යුතු මුදල අය කර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධව කටයුතු කර ඇති අතර අනිත් නිලධාරියාගේ ණය ශේෂය පියවීමට කටයුතු කරන |

ලෙස ඔහු වෙත ලිඛිතව දැනුම් දී ඇත.

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

**--------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඒ යටතේ වූ දර්ශක ප්‍රධාන කර ගනිමින් එම අරමුණු හා දර්ශක හඳුනා ගැනීම හා ළඟා කර ගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අවධානය යොමු කළ යුතු වුවද එම අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු කළයුතු වීම. | තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සමබන්ධ පිළියෙල කරන ලද සැලසුම එවා ඇත. |